# ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාකාරිත්වය (කැස්බෑව නගර සභාව කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින්)

**එච්.ඊ.එන්. ප්‍රියදර්ශනී**

දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.

nilupriyadarshani120@gmail.com

## අධ්‍යයනය පිළිබඳ හැඳින්වීම

80 දශකයෙන් පසු කාලවකවානුව තුළ දේශපාලන ක්ෂේත්‍රය තුළට එකතු වූ සංකල්ප අතර යහපාලන සංකල්පය ඉතා වැදගත් මාතෘකාවක් බවට පත්වී ඇත. යහපාලනය රාජ්‍යයක මධ්‍යම රජයට හෝ පළාත් පාලන ආයතන වලට පමණක් නොව ඕනෑම ආයතනයක මනා කළමනාකාරීත්වය සඳහා ක්‍රියාත්මක කල හැකි ප්‍රායෝගික සංකල්පයකි. ලාංකීය සමාජය තුළ 1931 ස්ථාපිත වන ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හරහා සර්වජන ඡන්ද බලය ලැබීමත් සමග ඇතිවන ප්‍රජාතන්ත්‍රික සමාජ ක්‍රියාවලිය නූතනය වන විට මූලික අරමුණු වලින් බැහැර වූ අකාර්යක්ෂමතාවයෙන් යුත් පාලන තන්ත්‍රයක් බවට පරිවර්තනය වෙමින් පවතී.

ලංකාවේ ප්‍රාදේශීය ආණ්ඩු අතුරින් ප්‍රාථමික ප්‍රාදේශීය ආණ්ඩු ලෙස හඳුනා ගත හැක්කේ ප්‍රාදේශීය සභා, නගර සභා හා මහනගර සභා ය. මෙම ආයතනයන්හි නෛතික විධිවිධාන සහ කාර්යභාරය ප්‍රායෝගිකව අධ්‍යයනය කිරීමෙන් යහපාලන සංකල්පයේ ප්‍රායෝගිකත්වය විමර්ශනය කල හැකිය. ඒ සඳහා ප්‍රාදේශීය ආණ්ඩු තුළ යහපාලන සංකල්පය කොතෙක් දුරට ගලපාගෙන තිබේ ද යන්න බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රිකයේ, කැස්බෑව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කැස්බෑව නගර සභාව පදනම් කරගෙන එම බලප්‍රදේශයේ මහජනතාව, ජනතා නියෝජිතයින් සහ නගර සභා නිළධාරීන් ආශ්‍රය කර ගනිමින් කරන ලද අධ්‍යයනය හරහා හඳුනාගත හැකි විය. ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාකාරීත්වය පිළිබදව කැස්බෑව නගර සභාව ආශ්‍රයෙන් අධ්‍යයනය කිරීමේ දී නගර සභාව එම මූලධර්ම කොතෙක් දුරට ගලපාගෙන ඇද්ද යන්න පිළිබදව විවිධ අදහස් ඉදිරිපත් විය. එවැනි අදහස් මතවාද මත පදනම්ව යහපාලන සංකල්පයෙහි ක්‍රියාත්මකභාවය පිළිබදව විමර්ශනය මෙමගින් සිදුවේ.

## අධ්‍යයන ක්‍රමවේදය හා අධ්‍යයන ක්ෂේත්‍රය

මෙම පර්යේෂණය තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආණ්ඩුකරණය සහ යහපාලන සංකල්පයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා කොළඹ දිස්ත්‍රිකයේ කැස්බෑව නගර සභාව කේන්ද්‍ර කරගන්නා ලදි. අධ්‍යයන නියැදිය තෝරා ගැනීමේ දී අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව සෑම අංශයක් ම නියෝජනය වන පරිදි නගර සභා සේවකයින් අතරින් 20 දෙනෙකුත්, මහජන නියෝජිතයන් අතරින් 10 දෙනෙකුත් සහ සාමාන්‍ය ජනතාව අතරින් 30 දෙනෙකුත් වන පරිදි 60 දෙනෙකුගෙන් සමන්විත වන නියැදියක් මත පදනම්ව මෙම පර්යේෂණය සිදුකරන ලදි. එමෙන්ම, දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික දත්ත මූලාශ්‍ර, ද්විතීක දත්ත මූලාශ්‍ර

භාවිතාකරන ලදි. ඒ අනුව ප්‍රාථමික දත්ත මූලාශ්‍ර යටතේ අධ්‍යයන ක්ෂේත්‍රයට ගොස් දත්ත ලබා ගැනීම සිදුකර අතර එහි දී පර්යේෂණ මාතෘකාවට අදාළව සකස් කරගනු ලබන ප්‍රශ්නාවලියක් මගින් කැස්බෑව නගර සභා බල ප්‍රදේශයට අයත් සාමාන්‍ය ජනතාව සහ නගර සභා සේවකයින්, මහජන නියෝජිතයින් යන පිරිස් අතරින් අහඹු ලෙස තෝරා ගත් කොටසකගෙන් තොරතුරු ලබා ගැනීම සහ නගර සභාවේ මහජන නියෝජිතයන්, සේවකයින් සහ ප්‍රදේශවාසින්ගෙන් සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබා ගැනීම සිදුකරන ලදි. ද්විතීක දත්ත මූලාශ්‍ර වශයෙන් පොත් පත්, පුවත් පත්, සඟරාලිපි, සහ අන්තර්ජාල ලිපි ආශ්‍රයෙන් තොරතුරු ලබා ගන්නා ලදි.

**සාහිත්‍ය විමර්ශනය**

යහපාලනය සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණය යනාදී සංකල්ප පිළිබඳව සාකච්ඡා කිරීමේදී විවිධ පර්යේෂකයන් මෙම සංකල්පයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳව ජාතික මට්ටමින් මෙන්ම ප්‍රාදේශිය මට්ටමින් ද විවිධ අධ්‍යයනයන් සිදුකර ග්‍රන්ථ හා පර්යේෂණ ප්‍රකාශන ලෙස එළි දක්වා ඇත. ඒ අනුව මෙම පර්යේෂණයන් හරහා යහපාලනය සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණය සම්බන්ධ ව පෙන්වා දුන් කරුණු මොනවා ද යන්න අවබෝධ කරගැනීම මූලික වශයෙන් වැදගත් වේ.

තුසිත අලුත් පටබැදිගේ සංස්කරණය කරනු ලද පැෆරල් සංවිධානය විසින් (2003) ප්‍රකාශයට පත් කළ ''යහපාලනය'' කෘතිය තුළ යහපාලනය සහිත සමාජයක් ස්ථාපිත කිරීමේ අරමුණින් යහපාලනය යනු කුමක් ද? යහපාලනයේ මූලිකාංග, යහපාලනයේ වර්තමාන භාවිතාව, යහපාලනය ඇති කිරීම සඳහා ජනතා සහභාගීත්වය කවරාකාර ද යනා දී ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරමින් යහපාලනයක් ගොඩ නැගීම සඳහා සිවිල් සමාජයේ දායකත්වය කවරාකාර වියයුතුද යන්න පිළිබඳව විවරණය කර තිබේ. එමෙන්ම යහපාලනය සම්බන්ධව අධ්‍යයනය කරන ලද තවත් විද්වතෙකු වන චම්මින්ද වෙලේගෙදර විසින් රචනා කරන ලද ''යහපාලනය'' (2006) කෘතිය තුළ විවිධ ක්ෂේත්‍ර අරඹයා යහපාලනය පිළිබඳ කරුණු ගෙනහැර දක්වා තිබේ. කතුවරයා කෘතිය තුළ යහපාලනය හා ආගමික සංකල්ප ගළපා කරුණු දක්වා තිබේ. බොහෝ විට කතුවරයා උත්සහ ගෙන ඇත්තේ සදාචාරමය ලෙස යහපාලනයේ අවශ්‍යතාවය පෙන්වා දීම වන අතර මෙකී අධ්‍යයනය තුළ වෙන් වෙන් වශයෙන් සදාචාර සංකල්ප විග්‍රහ නොකරන අතර පොදුවේ යහපාලන සංකල්පයේ ක්‍රියාත්මකභාවය පිළිබඳ විමර්ශනයක යෙදේ. සංවර්ධනය ළඟා කර ගැනීමට තුන්වන ලෝකයේ රටවල ඇතිකළ යුතු යහපාලනය පිළිබඳව සාකච්ඡා කරන ආචාර්ය .ඒ .එච්. ධනපාල විසින් රචිත ''21 වන සියවසේ ගෝලීය අර්බුදඃ ජනගහනය, දිළිඳුකම හා කුසගින්න'' (2006) කෘතිය තුළ පරිච්ඡේදයක් පුරා ප්‍රජාතන්ත්‍රකරණය තුළ යහපාලනයේ භූමිකාව හා එය සංවර්ධනය හා දක්වන සම්බන්ධතාව පිළිබඳව කරුණු සාකච්ඡා කර තිබේ. එච්. විමලසේන විසින් රචිත ''ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ආකෘති'' (1995) කෘතිය තුළ පොදුවේ ආසියාතික රාජ්‍යයන්ගේ අසාර්ථකභාවයට හේතු සහ එම රාජ්‍ය ආකෘති තුළ පාලන තන්ත්‍රය අභියෝගයකට ලක් වී ඇති ආකාරයත් පිළිබඳව කරුණු විමර්ශනය කරන අතර යහපාලනයක අවශ්‍යතාවය, ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ආකෘතිය තුළ ගොඩ නගා ගැනීම සම්බන්ධව කරුණු සාකච්ඡා කරයි. විරාජ් පෙරේරා විසින් රචිත, පැෆ්රල් සංවිධානය විසින් ප්‍රකාශයට පත්කර ඇති ''පළාත් පාලනය එදා සහ අද'' කෘතිය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා මූලෝපායක් ලෙස

මහජන නියෝජනය සඳහා ඇති ජාතික යාන්ත්‍රණයට අමතරව ප්‍රාදේශීය ආණ්ඩු යාන්ත්‍රණය ඇති කිරීම සම්බන්ධව සාකච්ඡා කර තිබෙන අතර ඒ තුළ පළාත් පාලනය යනු කුමක් ද? පළාත් පාලන ඉතිහාසය, පළාත් පාලනයේ නෛතික තත්ත්වය, පළාත් පාලන ආයතනයන්හි කාර්යභාරය සහ ශ්‍රී ලංකාවේ පළාත් පාලනයේ නව අභියෝග පිළිබඳව විමර්ශනයක් සිදුකර තිබේ. මාලනී ඇඳගම විසින් රචිත ''ශ්‍රී ලංකාවේ ගම් සභා ඉතිහාසය'' (1997) කෘතිය තුළ මෙරට පළාත් පාලනයේ මූලාරම්භය වන ගම්සභා ක්‍රමය පිළිබඳව විස්තරාත්මක ලෙස සාකච්ඡා කොට ඇත. ප්‍රාදේශීය ආණ්ඩුකරණය පිළිබඳව අතීත තොරතුරු මෙම කෘතිය තුළ අන්තර්ගත වන අතර, පළාත් පාලන ආයතනවලට වැඩි වශයෙන් බලතල බෙදා හැරිය යුතු බව කතුවරියගේ අදහස වේ. එමෙන්ම එච්. ආරියදාස විසින් රචිත ''ශ්‍රී ලංකාවේ පළාත් පාලන ඉතිහාසය'' (මූලාරම්භයේ සිට වර්තමානය දක්වා) කෘතිය තුළ (2007) පළාත් පාලන ආයතන වල පසුබිම පිළිබඳව සාකච්ඡා කරමින් ලංකාවේ පළාත් පාලනයේ ආරම්භයේ සිට මේ දක්වා විකාශනය පිළිබඳ කරුණු ගෙන හැර දක්වා තිබේ. පළාත් පාලනය සම්බන්ධව අධ්‍යයනය කරන ලද තවත් විද්වතෙකු වන උපුල් අබේරත්න විසින් රචිත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ප්‍රකාශයට පත්කොට ඇති ''පළාත් පාලන ආයතන'' (2007) කෘතිය තුළ පළාත් පාලන ආයතන පිළිබඳව සාකච්ඡා කර තිබෙන අතර එහිදී ප්‍රාදේශීය ආණ්ඩුවල ප්‍රජාතන්ත්‍රවාදී භාවිතය, ජන සහභාගීත්වය, ප්‍රාදේශීය ආණ්ඩුවල වගකීම, ප්‍රාදේශීය ආණ්ඩුකරණයේ ගැටලු පිළිබඳව පුළුල් වශයෙන් සාකච්ඡා කර තිබේ. ප්‍රාදේශීය ආණ්ඩු සම්බන්ධව අධ්‍යයනය කරන ලද විද්වතෙකු වන ධම්ම දිසානායක විසින් රචිත (2007) ''ප්‍රාදේශීය ආණ්ඩු පාලනය අරමුණු සහ ශික්ෂා'' කෘතිය තුළ ප්‍රාදේශීය ආණ්ඩු හා සම්බන්ධ ලෝක තත්ත්වය මෙන්ම ලංකාවේ තත්ත්වය පිළබඳව ද අධ්‍යයනයක් සිදු කර තිබේ. විශේෂයෙන් ප්‍රාදේශීය ආණ්ඩු පාලනයේ දී ජනතා නියෝජිතයින්, නිලධාරීන් සහ ජනතාව පිළිපැදිය යුතු ප්‍රාදේශීය ආණ්ඩු මූලධර්ම කිහිපයක් හඳුන්වා දීමට මෙහි දී උත්සහ ගෙන තිබෙන අතර ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආණ්ඩු පාලනය අවබෝධාත්මක, සක්‍රීය ජනතා සහභාගීත්ව ක්‍රියාවලියක් බවට පත් කර ගැනීමට උත්සහ ගෙන තිබේ.

මේ ආකාරයට විවිධ පර්යේෂකයන් හා ආයතන යහපාලනය සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණය සම්බන්ධව විවිධ අධ්‍යයන සිදු කර තිබේ. මෙම අධ්‍යයනයන් හරහා යහපාලන සංකල්පය හා ප්‍රාදේශීය ආණ්ඩු පිළිබඳව පුළුල් වශයෙන් වෙන වෙනම සාකච්ඡා කර තිබීම එමගින් දැකගත හැක. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආණ්ඩුකරණය සහ යහපාලන සංකල්පය පිළිබඳ අධ්‍යයනය කිරීම හරහා මීට පෙර කරන ලද අධ්‍යයනයන්ට වඩා වෙනස්ව කැස්බෑව නගර සභාව ආශ්‍රයෙන් යහපාලන සංකල්පයේ ක්‍රියාකාරිත්වය පිළබඳව ප්‍රායෝගික තත්ත්වය විමසා බැලීමක් මෙම පර්යේෂණය තුළින් සිදුකර ඇත. මේ අනුව මෙම අධ්‍යයනය හරහා ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාත්මකභාවය පිළිබඳව විමසා බැලීමක් සිදු වූ බැවින් මෙතෙක් යහපාලනය සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණය සම්බන්ධව සිදුකරන ලද අධ්‍යයනයන්ට වඩා වෙනස් ආකාරයේ අධ්‍යයනයක් බව සඳහන් කළ අතරම පර්යේෂණයන්හි තිබෙන්නා වූ පරතරය මනා විග්‍රයක් ලෙස දැක්විය හැක.

**යහපාලනය පිළිබඳ සංකල්පීය විශ්ලේෂණය**

යහපාලනය යනු සංකල්පයක් ලෙස මෑතකාලීනව සාකච්ඡාවට බඳුන්වූ මාතෘකාවකි. එමෙන්ම දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට එක් වූ නවාංගයක් ලෙසට ද දැක්විය හැක. නමුත් මෙම සංකල්පය පිළිබඳව අතීතයේ සිට සැලකිල්ලක් දැක්වූ විවිධ විද්වතුන් පර්යේෂණ රාශියක් සිදුකරන ලදි. ඒ අතර ඇරිස්ටෝටල්, ප්ලේටෝ වැනි ප්‍රමුඛ පෙළේ දාර්ශනිකයෝද විය.

යහපාලනය පිළිබඳව සැලකීමේදී ඒ සඳහා නිර්වචන බොහොමයක් පවතින නමුත් පොදු එක්මතයක් ගොඩනැගී නොමැත. නමුත් විද්වතුන් ඇතුලු බොහොමයක් දෙනා ඒකමතික එකග වූ අංග අටක් යහපාලන සංකල්පයට අන්තර්ගතය එනම්,

| | | |
|---|---|---|
| i. | සහභාගිත්වය | Participation |
| ii. | නීතියේ ආධිපත්‍ය | Rule of Law |
| iii. | විනිවිදභාවය | Transparency |
| iv. | ප්‍රතිචාරාත්මක බව | Responsiveness |
| v. | සම්මුතිපාදක වීම | Consensuas Orientad |
| vi. | සමානාත්මතාවය සහ ඇතුළත් කිරීම. | Equity and inclusiveness |
| vii. | ප්‍රතිඵලදායක බව සහ කාර්යක්ෂමභාවය | Effectiveness and efficiency |
| viii. | වගවීම. | Accountability (Graham, 2003:3-4). |

ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශවයේම සහභාගිත්වය යහපාලනයේ වැදගත් ලක්ෂණයකි. එමෙන්ම පක්ෂපාතිත්වයකින් තොරව සාධාරණ නීති රාමුවක අවශ්‍යතාවය නීතියේ අධිපත්‍යය තුළින් ගම්‍යවන අතර මිනිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත් ප්‍රධාන වශයෙන් සුළු ජන වාර්ගිකයන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමත් මෙමගින් අදහස් කරනු ලබයි. ව්‍යවස්ථාපිතව පවත්නා නීති අනුගමනය කරමින් තීන්දු තීරණ ගැනීමත් ඒවා ක්‍රියාත්මක කිරීමත් විනිවිදභාවය මගින් අදහස් කරයි. ආයතන හා ක්‍රියාවලීන් සාධාරණ කාල පරාසයක් තුළ සියලුම පාර්ශවකරුවන්ට සේවය කිරීමේ අවශ්‍යතාවය ප්‍රතිචාරාත්මක බව යනුවෙන් අදහස් වේ. සමස්ථ සමාජයක් වඩාත්ම හොඳ යහපත වෙනුවෙන් විවිධ අභිලාෂයන් ගේ මැදිහත්වීමක් තුළින් පොදු එකඟත්වයක් ඇති කර ගැනීමත් එය කෙසේ ක්‍රියාත්මක කළ හැකිද යන්නත් සම්මුතිපාදක වීම මගින් අදහස් කෙරේ. සමස්ත සමාජයේ සියලුම දෙනාටම එහි කොටස්කරුවන්ය යන හැඟීම පෙරදැරිව කටයුතුකර පවත්වාගෙන යාම සමානාත්මතාවය යනුවෙන් අදහස් කරනු ලබයි. යම්කිසි ආයතනයක හෝ පවත්නා සමාජයේ පවතින සම්පත් උපරිම ආකාරයෙන් භාවිතා කරමින් එම සමාජයේ අවශ්‍යතාවය නොපිරිහෙලා ඉටුකිරීම කාර්යක්ෂමතාවය යනුවෙන් අදහස් වේ. වගවීම යනු රාජ්‍යය ආයතන පමණක් නොව පුද්ගලික අංශයත්, සිවිල් සමාජයත් ඔවුන්ගේ පාර්ශවකරුවන්ට හා මහජනතාවට කෙරේ දක්වනු ලබන බැඳියාවයි. (Muhammad, 2006:388).

**ප්‍රාදේශිය ආණ්ඩුකරණය තුළ ජනතා සහභාගීත්වය**

ප්‍රාදේශිය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව විමර්ශනය කිරීමේ දී, යහපාලනයේ මූලික ලක්ෂණයක් ලෙස සහභාගීත්වය යන්න කොතෙක් දුරට ප්‍රාදේශිය ආණ්ඩුකරණය තුළට ගලපා ගෙන තිබේ ද යන්න විමසා බැලිය යුතුය. ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී ස්ත්‍රී, පූරුෂ, සුළුතර, බහුතර යනා දී සමාජයේ සමස්ත නියෝජනය ඵලදායීව සිදු වීම සහභාගීත්වය තුළින් අර්ථවත් වේ. ප්‍රාදේශිය ජනතාව දේශපාලන ක්‍රමයට සක්‍රීය ලෙස දායක කර ගැනීම ප්‍රාදේශිය ආණ්ඩු පිහිටු වීමේ මූලික අරමුණක් විය. නමුත් පැරණි ගම් සභා ක්‍රමයේ සිට වර්තමාන පළාත් පාලන ආයතන දක්වා විකාශනය වී ඇති ප්‍රාදේශිය ආණ්ඩු ක්‍රියාවලිය දෙස බලන විට ජනතාව පාලන ක්‍රියාවලියෙන් දුරස් කර ඇති බවක් දක්නට ලැබෙයි. මේ කෙරෙහි විශේෂයෙන් නූතන ගෝලීය සංකල්ප මෙන්ම ආර්ථික ක්‍රියාවලිය ක්‍රමයෙන් සංකීර්ණ වීම වැනි කාරණා බලපා තිබේ. විවෘත ආර්ථිකය සමග සාමූහිකත්වය වැනි ජන හැඟීම් අභියෝගයට ලක් වෙමින් තරගකාරීත්වය තුළ ආර්ථික ක්‍රියාවලියේ යාන්ත්‍රණයන් බවට මිනිසා පත්ව ඇත. මේ මත ප්‍රාදේශිය ආණ්ඩු පිහිටු වීමේ මූලික අරමුණක් වූ ප්‍රාදේශිය ජනතාව සක්‍රීය ලෙස දේශපාලන ක්‍රමයට දායක කර ගැනීමේ අවස්ථාව මග හැරී ඇත. නූතන ප්‍රාදේශිය ආණ්ඩු තුළ ඡන්ද බලය හා බදු ගෙවීම යන මූලික සාධක දෙක මත ජනතාවගේ සහභාගීත්වය රදා පවතී. ඡන්ද බලය ජනතා සහභාගීත්වය නිරූපනය කරන්නා වූ ප්‍රධාන සාධකයක් වුවත් වර්තමානයේ ප්‍රාදේශිය මැතිවරණ ක්‍රියාවලියේ දී ඡන්ද බලය අවම ප්‍රතිශතයක් භාවිතා කිරීම දක්නට ලැබෙන මූලික තත්ත්වයකි. විශේෂයෙන් වත්මන් දේශපාලන පක්ෂ සංස්කෘතිය හා ඒ හා බැඳුණු ක්‍රියාවලිය කෙරෙහි බොහෝ දෙනෙකු කලකිරීමට පත්වීම, කාර්යබහුලත්වය, නියෝජිතයින් තෝරා පත් කර ගැනීම වැදගත් කොට නොසැලකීම යනා දී කාරණා මත ජනතාව ඡන්ද චර්යාවෙන් ඉවත් වෙමින් සිටී. වඩාත් සංවේදී ලෙස ප්‍රාදේශිය ආණ්ඩු ක්‍රියා නොකිරීම ප්‍රාදේශිය ආණ්ඩු කෙරෙහි ජනතා විශ්වාසය පළුදු වීමට හේතුවක් වී තිබෙයි.

කැස්බෑව නගර සභාවේ කටයුතු සඳහා ජනතා සහභාගීත්වය කෙබඳු ද යන්න සම්බන්ධව ප්‍රදේශයේ ජනතාව, මහජන නියෝජිතයින් සහ නගර සභා සේවකයින්ගෙන් ලබාගත් දත්ත මගින් විවිධ අදහස් ලබා ගත හැකි විය. ඒ අනුව යහපත් පළාත් පාලන ක්‍රමයක් පවත්වා ගෙන යාම සඳහා මහජන නියෝජිතයින්ට විශේෂ කාර්යභාරයක් පැවරී ඇත. එහි දී ඔවුන් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට නිසි දායකත්වයක් ලබා දීම අත්‍යාවශ්‍යය. ඒ අනුව මහා සභා රැස්වීම් හා කාරක සභා රැස්වීම් වලදී ජනතා අවශ්‍යතාවයන් අතුරින් ප්‍රමුඛතාවය අනුව දත්ත හා තොරතුරු යථාර්ථවාදීව විශ්ලේශණය කර අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු වේ. නගර සභා සභිකයින් ජනතාව විසින් තෝරා ගනු ලබන්නේ තමන්ගේ නියෝජිතයින් ලෙස උපරිම සේවයක් ලබා ගැනීම පහසුකර ගැනීම සඳහාය. ඒ අනුව මහජනතාවගේ අපේක්ෂාවන් මැනවින් හඳුනා ගෙන ඒවා ඉටු කිරීමටත්, සාමූහිකව ක්‍රියා කිරීමටත්, නගර සභා සේවාවන් වැඩි දියුණු කිරිම සඳහා ජනතාවගේ පුළුල් සහභාගීත්වයක් ලබා ගැනීමට ද මහජන නියෝජිතයින් කටයුතු කල යුතුය. ජනතා සහභාගීත්වය පුළුල් කිරිම ප්‍රාදේශිය ආණ්ඩුකරණය තුළ යහපාලනයක් ගොඩනගා ගැනීමට ඉවහල් වේ.

කැස්බෑව නගර සභාවේ ප්‍රතිපත්ති තීරණ සම්බන්ධයෙන් ජනතා සහභාගීත්වය කවරාකාර ද යන්න පිළිබඳව මහජනතාව ලබා දුන් තොරතුරු පහත වගුවෙන් නිරූපනය කල හැකිය.

**වගුව 1- ප්‍රතිපත්ති තීරණ සඳහා ජනතාව සහභාගී කර ගැනිම පිළිබඳ තෘප්තිමත්භාවය.**

| නගර සභාව ගනු ලබන තීරණ සම්බන්ධයෙන් දැනුවත් බව | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| දැනුවත් | 4 | 13% |
| දැනුවත් නොමැත | 26 | 87% |
| | 30 | 100% |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණය 2015

ඉහත දත්ත පරීක්ෂා කිරිමේ දී පෙනී යන්නේ නගර සභාව ගනු ලබන තීරණ සම්බන්ධයෙන් ජනතාව සහභාගී කර ගැනීම පහළ මට්ටමක පවතින බවය. ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී සමස්ත ජනතාවගේ නියෝජනය සිදුවන ඵලදායී වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොවන බව 87% කගේ අදහස විය. නගර සභාව ගනු ලබන තීරණ සම්බන්ධයෙන් දැනුවත් බවක් ලබා ගත හැකි මාර්ගයක් නොමැති වීම. සම්බන්ධතාවය දුරස්ථ වීම, කාර්යබහුලත්වය, ජනතා සහභාගීත්වය අඩුවීමට ප්‍රධාන හේතු ලෙස ඔවුන් පෙන්වා දෙන ලදී. 13% කගේ අදහස වූයේ ලැබී ඇති බලතල අනුව නගර සභා පාලනය ප්‍රදේශයේ ජනතාව ඒකරාශී කරමින් මනා වැඩ පිළිවෙලක් ඉටු කිරීමට උත්සහ ගන්නා බවය. නමුත් බහුතර මතය අනුව පෙනී යන්නේ ප්‍රාදේශීය ආණ්ඩු පිහිටු වීමේ මූලික අරමුණු වලින් නගර සභා දුරස් වී ඇති බවය. දේශපාලන හිතවත්කම්, වෘත්තිය අනුව නගර සභාව හා සුළු පිරිසක් සම්බන්ධ වුව ද සමස්ත ජනතාවගෙන් බහුතරය නගර සභා කෙරෙන් දුරස්ථ වී ඇති බවක් පෙනීයයි.

මහජන නියෝජිතයින් සහ නගර සභා සේවකයින්ගේ මතය වූයේ ලැබී ඇති බලතල ප්‍රමාණවත් නොවීම, සම්පත් සීමිත වීම, වැනි ප්‍රායෝගික ලෙස මතු වී ඇති ගැටළු නිසා ජනතාව ප්‍රාදේශිය ආණ්ඩු තුළට සක්‍රීය ලෙස දායක කර ගැනීමේ ගැටළුමතු වී ඇති බවයි. නමුත් වත්මන් පාලනය නගර සභාව සතු බලතල හා සම්පත් උපරිම ආකාරයෙන් ප්‍රයෝජනයට ගනිමින් ප්‍රදේශයේ ජනතාව ඒකරාශී කරමින් මනා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරමින් ජනතා සුභ සිද්ධිය වෙනුවෙන් කැපවන බවට අදහස් දක්වන ලදී. මහජන නියෝජිතයින් ලෙස නිරන්තරයෙන් ජනතා අවශ්‍යතා ඉටු කර දීමට කැප වන බව ඔවුන්ගේ මතය විය. මහජනතාව නගර සභා පාලනයෙන් දුරස් වීමට හේතු කිහිපයක් මොවුන් පෙන්වා දෙන ලදී. ඒ අතර, තරගකාරී ආර්ථීක රටාව, පක්ෂ දේශපාලනය පිළිබඳ කලකිරීම, ප්‍රාදේශීය දේශපාලන ආයතන කෙරෙහි විශ්වාසයක් නොවීම, දැනුවත්භාවයක් නොමැති වීම, කාර්ය බහුලත්වය ප්‍රධාන වේ.

යහපාලනයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය දේශපාලන සහභාගීත්වය ජනතාවගේ බහුතර අදහස් විමසීමේ දී ජනතා සහභාගීත්වය වැදගත් කොට සලකා නොමැති බව පෙනී යයි. ප්‍රාදේශීය ආණ්ඩු තුළ යහපාලනයක් ඇති කර ගැනීම සඳහා මහජනතාව සක්‍රීය ලෙස ඊට දායක කර ගත යුතුය. සමාජයට

හිතකර ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා බහුතර නියෝජනය ඵලදායීව ලබා ගත යුතුය. නමුත් මැතිවරණයේ දී පාලකයින් නගර සභාවට තෝරාපත් කර ගැනීම හැරුණු විට ඉන් ඉදිරියට යහපාලනයක් පවත්වා ගෙන යාමට, මහජනතාව ලෙස තමන්ට ලබා දිය හැකි දායකත්වය පිළිබඳව ජනතාව දැනුවත් වී නොමැත. ප්‍රාදේශීය පාලකයින් ද දේශපාලන ක්‍රමයෙන් දුරස්ථව සිටින ජනතාව පාලන ක්‍රමයට සක්‍රීය ලෙස දායක කර ගැනීමේ විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ආකාරයක් දක්නට නොලැබේ. පනගර සභාවෙන් ක්‍රියාත්මක කරන වැඩ සටහන් සම්බන්ධයෙන් ජනතා සහභාගීත්වය විමසන විට ඒ පිළිබඳව පැහැදිලි වේ.

**ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ විනිවිදභාවයේ ක්‍රියාත්මකභාවය**

යහපාලනයේ මූලික මූලධර්මයක් ලෙස හඳුනා ගත හැකි විනිවිදභාවය ඕනෑම ආයතනයක පාලනයේ යහපත් බව ගොඩනගා ගැනීමට ඉවහල් වේ. ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාකාරීත්වය විමර්ශනය කරන විට ජනතාවගේ ආයතන ලෙස පළාත් පාලන ආයතන වලට නියෝජිතයින් තෝරා පත් කර ගනු ලබන්නේ බදු ගෙවන ජනතාවයි. එම නිසා එහි කෙරෙන සෑම කටයුත්තක්ම දැන ගැනීමට ජනතාවට අයිතියක් ඇත. නගර සභා කටයුතු සම්බන්ධව කථා කරන විට ඒ සම්බන්ධයෙන් වූ ඕනෑම ලියවිල්ලක් පරීක්ෂා කිරීමට ජනතාවට බලය තිබේ. ඒ හෙයින් ඊට සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම නගර සභා පාලනයේ වගකීම වේ. එසේම පොදු මහජනතාවට සභාවේ මහා සභා රැස්වීම් වලට සහ කාරක සභා රැස්වීම් වලට නිරීක්ෂකයින් ලෙස සහභාගී වීමට ඉඩ සලසා දීම ද විනිවිදභාවය ඇතිවීමට හේතු වේ. නගර සභාවක ප්‍රධාන පරිපාලන නිළධාරියා වන ලේකම්වරයාගේ සිට පහළ නිළධාරීන් දක්වා වූ පිරිස මෙන්ම ජනතා නියෝජිතයින් සෑම විටම විවෘතව ක්‍රියා කිරීම වැදගත්ය. එසේ ක්‍රියා කිරීමෙන් මහජන නියෝජිතයින් කෙරෙහි ජනතා විශ්වාසය වර්ධනය වන අතර ඔවුන් පිළිබඳව හොඳ ආකල්පයක් ජනතාව තුළ ගොඩ නැගේ.

ඕනෑම ආයතනයක විනිවිදභාවය පවත්වා ගෙන යාම සඳහා එම ආයතනය අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය පිළිබඳව ජනතාව දැනුවත් කල යුතුය. නගර සභාව ආයතනයක් ලෙස එක් එක් විෂයන් සම්බන්ධයෙන් ජනතාව සේවාවන් ලබා ගත යුතු ආකාරය සහ එම සේවා සම්බන්ධව කටයුතු කරන නිළධාරීන් පිළිබඳව ජනතාවට මග පෙන්වීමක් කල යුතුය. නගර සභාවෙන් සැපයෙන සේවාවන් පිළිබඳව ජනතාවට මග පෙන්වීමක් කල යුතුය. කැස්බෑව නගර සභා බල ප්‍රදේශයේ ජනතාව සම්බන්ධ කර ගනිමින් කල අධ්‍යයනයේ දී පෙනී ගිය ආකාරයට බොහෝ ජනතාව නගර සභාවෙන් සැපයෙන සේවාවන් ලෙස හඳුනා ගෙන තිබෙන්නේ, කුණු කසල ඉවත් කිරීම, මාර්ග සංවර්ධනය, යටිතල පහසුකම් සැපයීම, විථි ආලෝක කිරීම යනාදි සීමිත කාර්යයන් කිහිපයක් පිළිබඳව පමණි. නමුත් නගර සභා හරහා බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය සඳහා පුළුල් සේවාවක් සැපයෙන බව නගර සභා සේවා හරහා වටහා ගත හැකිය. නමුත් ජනතාවට ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැත. නගර සභාවෙන් සැපයෙන සේවාවන් පිළිබඳ ජනතාවට තොරතුරු ලබා ගත හැකි ආකාරයේ විනිවිදභාවයෙන් යුතු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම කාලෝචිත වේ. කැස්බෑව නගර සභාව තුළ එම ආයතනයේ මෙහෙවර, දැක්ම, නියෝජිත නාමාවලිය, සංවිධාන සටහන ආදිය ප්‍රදර්ශනය කිරීම හරහා යම් ප්‍රමාණයක විනිවිදභාවයක් ඇති කිරීමට උත්සහ ගෙන තිබේ.

ඕනෑම ආයතනයක විනිවිදභාවය පිළිබඳව කතා කරන විට එම ආයතනයේ මූල්‍ය කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු වෙයි. දේශපාලන ආයතනයක මූල්‍ය කටයුතු කෙරෙහි ජනතා විශ්වාසය පළුදු වී ඇත්නම් එහි පරිපාලනය නිසි පරිදි පවත්වා ගෙන යා නොහැකිය. ප්‍රාදේශිය ආණ්ඩු ජනතාව හා සහයෝගයෙන් කටයුතු කරන ඔවුන්ගේ විශ්වාසය මත ගොඩනැගිය යුතු පාලන ක්‍රමයකි. ප්‍රතිපත්ති තීරණ, ව්‍යාපෘති, මූල්‍ය කටයුතු ආදිය පිළිබඳව ජනතාවට තොරතුරු සැපයීමට ප්‍රාදේශීය ආණ්ඩු බැදී සිටියි. ඕනෑම ප්‍රාදේශීය ආණ්ඩුවක මෙන්ම කැස්බෑව නගර සභාවේ ද විනිවිදභාවය නිරූපනය කරන්නා වූ ලියවිල්ලක් ලෙස අයවැය ලේඛණය හදුනා ගත හැකිය. නගර සභාව වර්ෂයක් පාසා බල ප්‍රදේශයේ බදු ගෙවන ජනතාවගේ බදු මුදල් නැවත ඔවුන් වෙනුවෙන් වැය කරන ආකාරය පිළිබදව විනිවිදභාවයෙන් යුතුව ජනතාවට සන්නිවේදනය කිරීමේ මාධ්‍යයක් ලෙස අයවැය ලේඛණය යොදා ගනී. මේ ආකාරයට වර්ෂයක් පාසා නගර සභාව විසින් ජනතාවට මූල්‍ය කටයුතු පරිහරණය කරන ආකාරය පිළිබදව ප්‍රකාශයට පත් කිරීම හරහා නගර සභාවේ විනිවිදභාවය පෙන්නුම් කිරීමට පමණක් නොව මහජන නියෝජිතයින් තම බදු මුදල් කෙසේ පරිහරණය කරන්නේ ද තම අවශ්‍යතා කොතෙක් දුරට සපුරා දීමට උත්සහ ගන්නේ ද යන්න පිළිබදව විමසා බැලීමට අවස්ථාව උදාවේ. නමුත් කැස්බෑව නගර සභාව ආශ්‍රය කර ගනිමින් අදාල බල ප්‍රදේශයේ ජනතාව සමග කල සාකච්ඡාව මගින් අනාවරණය වූයේ ජනතාවට ඒ පිළිබද අවබෝධයක් හෝ උනන්දුවක් නොමැති බවයි.


නගර සභා පාලනයේ දූෂණ වංචා සිදු නොවන බවට අදහස් පළකල 47% ක් වූ මහජනතාවගේ අදහස වූයේ කාර්යබහුලත්වය, කරුණු නිශ්චිත ලෙස නොදැනීම, නගර සභා පාලනයට අඩු අවධානයක් යොමු කිරීම වැනි හේතු නිසා ඒ පිළිබදව නිශ්චිත අවබෝධයක් නොමැති බවයි. නගර සභා පාලනය තුළ දූෂණ වංචා සිදු නොවන බවට නිළධාරීන් 45% ක් ද මහජන නියෝජිතයින් 50% ක් ද අදහස් පළකල අතර නිළධාරින් අතුරින් 30% ක් ද මහජන නියෝජිතයින් 20% ක් ද නිශ්චිත පිළිතුරක් ලබා දීමට මැලි විය. ඔවුන් දූෂණ වංචා සිදු වන බව ඍජුව ප්‍රකාශ කිරීම මැලි වුව ද වක්‍රාකාරව ඔවුන් ප්‍රකාශ කලේ නගර සභා පාලනය තුළ දූෂණ වංචා සිදු වන බවයි.

මේ අනුව ඉහත දත්ත දෙස බලන විට පෙනී යන්නේ නගර සභා පාලනයේ සිදු වන දූෂණ වංචා අක්‍රමිකතා හේතුවෙන් නගර සභාව තුළ විනිවිදභාවයක් දක්නට නොමැති බවයි. මහජනතාව, නිළධාරීන් සහ මහජන නියෝජිතයින් ලබා දුන් තොරතුරු පොදුවේ ගත් විට 47% කගේ අදහස වන්නේ නගර සභා පාලනය තුළ දූෂණ වංචා සිදු වන බවයි. 40% ක් දූෂණ වංචා සිදු නොවන බවට ප්‍රකාශ කල ද දූෂණ වංචා සිදු වන බවට නිශ්චිතව පිළිතුරු ලබා දීමට අකමැති වූ 13% ක ප්‍රමාණය සහ දූෂණ වංචා සිදු වනවාය යනුවෙන් අදහස් පළ කල 47% ගත් විට 60% ක ප්‍රතිශතයක් දූෂණ වංචා නගර සභාව ආශ්‍රිතව සිදු වන බවට පිළිගෙන තිබේ.

**ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ කාර්යක්ෂමතාවයේ ස්වරූපය**

ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාත්මකභාවය කැස්බෑව නගර සභාව ආශ්‍රයෙන් විමර්ශනය කරන විට යහපාලනයේ මූලිකාංගයක් වන කාර්යක්ෂමතාවය කොතෙක් දුරට එම ආයතනය තුළට ගලපා ගෙන තිබේ ද යන්න වැදගත් සාධකයක් වේ. ආයතනය තුළ ඇති සම්පත් ඵලදායී

ලෙස භාවිතා කරමින්, සමාජ අවශ්‍යතා, ඉලක්ක අරමුණු කරා නියමිත කාල රාමුවක් තුළ ගුණාත්මකභාවයකින් යුක්තව සේවා ඉටු කර දීම කාර්යක්ෂමතාවයෙන් අදහස් වේ. නගර සභාව ජනතා ආයතනයක් ලෙස ප්‍රදේශයේ ජනතාවගේ පහසුව හා සුභසාධනය වර්ධනය කිරීමට සහ සේවා පහසුකම් සැපයීමට බැඳී සිටී. නීතියෙන් පැවරී ඇති සීමිත සම්පත් නගර සභාව සතු වේ. මෙම සීමිත සම්පත් ඵලදායී ලෙස භාවිතා කරමින් ජනතා උන්නතිය ඉහළ මට්ටමකින් ලබා දීමට ආයතනික වශයෙන් ප්‍රාදේශීය ආණ්ඩු කටයුතු කල යුතුය. ආයතනික සේවකයන් මෙන්ම, මහජන නියෝජිතයින් මහජනතාවගේ අවශ්‍යතා හා ඔවුන්ගේ සුභ සිද්ධියට ඉවහල් වන ආකාරයේ කාර්යක්ෂම සේවාවක් ලබා දීමට කැප විය යුතුය. බොහෝ විට සෑම ක්ෂේත්‍රයකම විහිදී පවත්නා අකාර්යක්ෂමතාවය යහපාලනයක් සහිත පාලන තන්ත්‍රයක් බිහිකර ගැනීමට බාධාවක් වේ. පොදුවේ ගත් විට ප්‍රාදේශීය ආණ්ඩු තුළ අකාර්යක්ෂමතාවය සහ සම්පත් නිසි පරිදි ප්‍රයෝජනයට නොගැනීමේ දුර්වලතා දක්නට ලැබෙයි. කැසබෑව නගර සභාව ආශ්‍රයෙන් කාර්යක්ෂමතාවයේ ස්වභාවය තේරුම් ගැනීම සඳහා ජනතාව දක්වන ලද අදහස් විමර්ශනය කර බැලීම වැදගත් වේ.




***ප්‍රස්ථාර 1- නගර සභාවේ කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් තෘප්තිමත්භාවය***

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණය 2015

කැස්බෑව නගර සභාවේ කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් අදහස් දැක්වූ ජනතාවගෙන් 47% ක් පමණ පිරිසකගේ අදහස වූයේ නගර සභාව තුළ කාර්යක්ෂම පාලනයක් පවතින බවයි. ඊට සාපේක්ෂව 40% කගේ

අදහස වූයේ නගරසභා පාලනය කාර්යක්‍ෂමතාවයෙන් තොර බවයි. මාර්ග සැකසීමේ දී අනවශ්‍ය ප්‍රමාදයක් සිදු වේ. නගර සභාවට අයත් බොහෝ ප්‍රධාන මාර්ග දුබල තත්ත්වයේ පවතින අතර එම මාර්ග පිළිසකර කිරීම ප්‍රමාද වෙමින් පවතින තත්ත්වය තුළ සමහර මන්ත්‍රීවරුන් තමන්ට පෞද්ගලිකව ලැබෙන ප්‍රතිපාදන මත පෞද්ගලික පාරවල් සංවර්ධනය කරන බවට ජනතාව චෝදනා එල්ල කරන ලදී. එමෙන්ම ප්‍රදේශයේ කුණු සම්බන්ධයෙන් මතු වී ඇති ගැටළු වල දී කාර්යක්‍ෂම වැඩපිළිවෙලක් සකසා ගැනීමට අපොහොසත් වී ඇති බව ජනතාවගේ අදහස විය. අයථා ප්‍රතිපාදන මත සමහර සේවාවන්ගේ කාර්යක්‍ෂමතාවය රදා පවතින බවත් මහජනතාවගේ සුභසාධන කටයුතු කාර්යක්‍ෂමව ඉටුකිරීමට ඉදිරිපත් නොවන බවටත් කාර්යක්‍ෂමතාවයක් නොමැති බවට අදහස් පළකල පිරිසගේ අදහස විය. 13% කගේ අදහස වූයේ සමහර අවස්ථාවලදී නගර සභා පාලනයේ කාර්යක්‍ෂමතාවය සම්බන්ධයෙන් තෘප්තිමත් විය හැකි වුව ද සමහර අවස්ථාවලදී එසේ තෘප්තිමත් විය නොහැකි බවයි. සමහර අවස්ථාවලදී බලාපොරොත්තු වන ආකාරයේ සේවාවක් නගර සභාවෙන් ලබා ගැනීමට නොහැකි වන බවත් සමහර අවස්ථාවලදී අනවශ්‍ය ප්‍රමාදය, හිතවතුන්ට වැඩි සැලකිල්ලක් දැක්වීම, නිළධාරීන් සිය කාර්යභාරයන් මැනවින් ඉටු නොකිරීම යන හේතු සාධක මත කාර්යක්‍ෂමතාවය සම්බන්ධයෙන් තෘප්තිමත් විය නොහැකි බවට ප්‍රකාශ කරන ලදී.

**වගුව 2- නගර සභාව ප්‍රදේශයේ සම්පත් නිසි පරිදි සංවර්ධනයට යොදා ගැනීම පිළිබද තෘප්තිමත් බව.**

| සම්පත් නිසි පරිදි සංවර්ධනයට යොදා ගැනීම පිළිබද තෘප්තිමත් බව | මහජනතාව | | නිළධාරීන් | | මහජන නියෝජිතයින් | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| තෘප්තිමත් | 10 | 33% | 12 | 60% | 5 | 50% |
| තෘප්තිමත් නොමැත | 12 | 40% | 8 | 40% | 5 | 50% |
| අවබෝධයක් නොමැත | 8 | 27% | - | - | - | - |
| | 30 | 100% | 20 | 100% | 10 | 100% |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණය 2015

කාර්යක්‍ෂම පාලනයක් ගෙනයාම සඳහා නගර සභා බල ප්‍රදේශයේ පවතින සම්පත් නිසි පරිදි සංවර්ධන කාර්යයට යොදා ගෙන තිබේ ද යන්න පිළිබදව මහජනතාව, නිළධාරීන් සහ මහජන නියෝජිතයින් සම්බන්ධ කර ගනිමින් කල විමර්ශනයේ දී මහජනතාවගෙන් 33% ඒ සම්බන්ධව තෘප්තිමත් වන අතර 40% ක් ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් නොවේ. ඔවුන් ප්‍රකාශ කල ආකාරයට වැදගත්ම සම්පත වන මානව සම්පත නගර සභාව සිය කාර්යයේ දී සම්පත් දායකයින් ලෙස යොදාගෙන නොමැති කාර්ය බහුලත්වය, නගර සභා පාලනය කෙරෙහි අඩු අවධානයක් යොමු කිරීම වැනි හේතු මත 27% කගේ අදහස වූයේ නගර සභාව සිය පාලන කටයුතු පවත්වාගෙන යාමේ දී ප්‍රදේශයේ සම්පත් කාර්යක්‍ෂම ලෙස යොදවා ගැනීම සම්බන්ධයෙන් අවබෝධයක් ඔවුන්ට නොමැති බවයි.

නගර සභා බල ප්‍රදේශයේ සම්පත් පරිහරනය පිළිබඳව අදහස් දැක්වූ නිළධාරීන් 60% සහ මහජන නියෝජිතයින් 50% කගේ අදහස වූයේ සභාව සතු භෞතික හා මානව සම්පත් අවම වුව ද උපරිම ඵලදායීතාවයකින් යුතුව සේවයේ යොදවා ඇති බවයි. එමෙන්ම ප්‍රදේශයේ ඇති සියලු භෞතික සම්පත් නගර සභාව සතු නොවන බවත් ඒවායෙන් සුළු ප්‍රමාණයක් පමණක් නගර සභාව සතු වන බවත් එම සීමිත සම්පත් උපරිම කාර්යක්‍ෂම පාලනයක් ගෙන යාමට යොදා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. නගර සභාව සතු ප්‍රයෝජනයට නොගන්නා භෞතික සම්පත් විශාල වශයෙන් පවතින බැවින් සම්පත් කාර්යක්‍ෂම ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් තෘප්තිමත් නොවන නිළධාරීන් 40% ක් ද මහජන නියෝජිතයින් 50% ක් ද විය.

ඉහත අදහස් සැලකිල්ලට ගැනීමේ දී යහපාලනයක් ඇති කිරිම සඳහා කාර්යක්‍ෂමතාවය සඳහා ඉහළ වටිනාකමක් ලබා දිය යුතු බව පෙනෙයි. කාර්යක්‍ෂමතාවය පිළිබඳව ජනතාවට නිශ්චිත අවබෝධයක් නොමැති වීම සහ ඒ සඳහා බලපෑමක් සිදු කිරීමට ජනතාව ඉදිරිපත් නොවීම ගැටළුකාරී වෙයි. නගර සභා පාලනය කෙරෙහි ජනතාව එතරම් උනන්දුවක් නොදැක්වීම ද මේ කෙරෙහි බලපා තිබෙයි. නගර සභා ඇතුළු සියලු පළාත් පාලන ආයතන දේශපාලන නායකයන්ගේ හා පරිපාලන නිළධාරීන්ගේ සංයුතියකින් සමන්විත වන නිසා එම ආයතන අනෙකුත් ආයතනයන්ගෙන් වෙනස් වෙයි. මෙහිදී දේශපාලකයා නිළධාරියා සමගත්, නිළධාරියා දේශපාලන නියෝජිතයා සමගත් නිරතුරු සම්බන්ධ වේ. මේ දෙදෙනාම එකට හිඳීම තුළින් වඩා යහපත් පාලනයක් හා ප්‍රජාතන්ත්‍රවාදයක් ඇතිවේ යැයි විශ්වාස කෙරේ. මෙසේ එක්ව කටයුතු කිරීමෙන් දේශපාලකයාට නිළධාරියෙකු මෙන්ද, නිළධාරියාට දේශපාලකයෙකු මෙන්ද කටයුතු කිරීමට සිදු වේ. දේශපාලන නියෝජිතයා මහජනතාව නියෝජනය කරන බැවින් නිළධාරියාට ප්‍රතික්ෂේප කල නොහැකි වේ. දේශපාලකයා මහජන අවශ්‍යතා හඳුනා ගන්නා අතර නිළධාරියා දේශපාලකයාගේ වුවමනා හඳුනා ගත යුතුය. දේශපාලන අධිකාරිය කාර්යක්‍ෂම වුවද පරිපාලන ක්‍රමය අකාර්යක්‍ෂමතාවයෙන් යුක්ත නම් එය ජනතාවට ඵලදායී සේවාවක් සැපයීමට බාධාකාරී වෙයි. නගර සභා පාලනය ගොඩනැගී ඇත්තේ සාම්ප්‍රදායික සේවකයන් පිරිසක් වටා බැවින් ඔවුන්ගේ ක්‍රියාකලාපය ඍජුවම ජනතාවට කාර්යක්‍ෂම සේවාවක් ලබා දිම සම්බන්ධයෙන් බලපායි. ජනතාව දේශපාලන ක්‍රමයෙන් දුරස් වීමද නගර සභාවන්හී කාර්යක්‍ෂමතාවය දුබල විම කෙරෙහි බලපා තිබේ. එමෙන්ම නගර සභාවන්ට හිමිව ඇති සීමිත බලතල රාමුව තුළ සිට පුළුල් වැඩ කොටසක් ක්‍රියාත්මක කිරීමට සිදුවිම ද නගර සභා පාලනයේ අකාර්යක්‍ෂමතාවය කෙරෙහි බලපා තිබේ.

**වගකිවයුතුභාවය**

යහපත් ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් පවත්වා ගැනීමේ දී යහපාලනයේ මූලිකාංගයක් ලෙස හඳුනා ගත හැකි වගකිව යුතුභාවය කෙරෙහි ද අවධානය යොමු කල යුතුය. නගර සභා සම්බන්ධයෙන් කතා කරන විට නගර සභාවේ ප්‍රධානියා ඇතුළු මහජන නියෝජිතයින් වෙත පැවරී ඇති සුවිශේෂී කාර්යයක් යන්නේ, නගර සභාවේ කටයුතු සම්බන්ධයෙන් ජනතාවට වගකිව යුතු වීමයි. යහපාලනයක් ඇතිකර ගැනීමට පාලකයන් ජනතාවට වගකීමට බැඳී සිටිය යුතුය. ජනතා විශ්වාසය රදවා තබා ගැනීමට වගකිවයුතුභාවය වැදගත් වේ. නගර සභාවට නියෝජිතයින් ලෙස තමන් තෝරා ගන්නා ජනතාවට මහජන නියෝජිතයින්

ලෙස, සේවාවන් සැපයීම, මුදල් වැය කිරිම, ආදායම් එකතු කිරීම යනාදී ක්ෂෙත්‍ර ආවරණය වන ආකාරයට වගකිව යුතුය. සේවාවන් සැපයීමේ දි ජනතාවට සපයනු ලබන මහජන සේවාවන් වල කාර්යක්ෂමතාවය, ඵලදායීතාවය, ප්‍රයෝජන ලබන ප්‍රදේශයේ ප්‍රමාණය ආදී කරුණු ගැන ජනතාවට වගකිව යුතුවේ. සේවාවන් උසස් තත්ත්වයකින් සහ වැඩිදෙනෙකුට ප්‍රයෝජනවත් වන ආකාරයට පවත්වාගෙන යාම නගර සභාවේ වගකීම වේ. නගර සභාව විසින් සපයන ලද සේවාවන්හී ප්‍රයෝජනවත්භාවය සම්බන්ධයෙන් ජනතාව විවිධ අදහස් දක්වන ලදී.

නගර සභාවෙන් සපයන ලද සේවාවන්හී ප්‍රයෝජනවත්භාවය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැකි බවට අදහස් දැක්වූවන් ගෙන් 80% ක් වූ බහුතරය ප්‍රකාශ කලේ නගර සභාවෙන් සපයන ලද සේවාවන් ජනතාවට ප්‍රයෝජනවත් වූ බවය. මාර්ග සංවර්ධනය හරහා පුළුල් මංමාවත්, විථි ලාම්පු පද්ධති, පුස්තකාල, ආදාහනාගාර, ක්‍රිඩාපිටි ඉදි කිරීම, සෞඛ්‍ය සායන පැවැත්වීම හරහා ප්‍රදේශයේ සීඝ්‍ර සංවර්ධනයක් ඇති කිරීමට කටයුතු කර තිබෙන බව ඔවුන්ගේ අදහස විය. ඊට සාපේක්ෂව සෑහීමකට පත්විය නොහැකි බවට අදහස් පළ කල 20% කගේ අදහස වූයේ කල සේවයට වඩා කලහැකි සේවය වැඩි බවය. පටු දේශපාලන පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ජනතාවගේ බදු මුදල්, සම්පත් අපතේ යැවීමත්, කොන්ත්‍රාත් ක්‍රමය හරහා විශාල වශයෙන් දූෂණ වංචා සිදු වන බවටත් ඔවුන් අදහස් දක්වන ලදී. එමෙන්ම අනවශ්‍ය දෙයට පළමු තැන ලබා දෙන බවට චෝදනා කරන ලදී.

නගර සභා පාලනය මුදල් වැය කිරිම සහ ආදායම් එකතු කිරිම සම්බන්ධයෙන් ජනතාවට වගකිව යුතුය. නගර සභාවෙන් ලැබෙන මූල්‍ය සම්පත් උපරිම ලෙස ප්‍රයෝජන ලැබෙන අයුරින් යෙදවීමත් මූල්‍ය කළමනාකරණයට අදාලව පවත්නා නීති-රීති හා පටිපාටි අනුගමනය කිරීමත් මෙහිදී වැදගත් වේ. එමෙන්ම ආදායම් එකතු කිරිමේ දී නගර සභාවට ලැබිය යුතු සියලුම ආදායම් නිසි පරිදි එකතු කිරීම සම්බන්ධයෙන් ජනතාවට වගකිව යුතුය. ඒ සඳහා විනාවාදභාවයෙන් යුතු වැඩ පිළිවෙලක් පවත්වාගෙන යාම නගර සභා පාලනයේ වගකීම වේ.

**සර්වසාධාරණත්වය**

යහපාලනයේ මූලිකාංගයක් ලෙස සර්වසාධාරණත්වය ප්‍රාදේශිය ආණ්ඩු තුළට කොතෙක් දුරට ගලපා ගෙන තිබේ ද යන්න පිළිබඳව කැස්බෑව නගර සභාව ආශ්‍රයෙන් විමර්ශනය කල හැකිය. සමස්ත සමාජයේ වෙසෙන සියලු දෙනාටම එක හා සමාන ලෙස සලකා කිසිදු වෙනසකින් තොරව සියලු දෙනාටම සාධාරණ ඉඩක් ලබා දීම සර්වසාධාරණත්වයෙන් අපේක්ෂා කරයි. කැස්බෑව නගර සභාව සර්වසාධාරණත්වය පිළිබඳ අදහස කොතෙක් දුරට ගලපා ගෙන තිබේ ද යන්න නගර සභාව සේවා සැපයීමේ දී එක් පාර්ශවයකට පමණක් විශේෂ සැලකිලි දක්වයි ද යන්න නිරූපිත පහත වගුවෙන් වටහා ගත හැකිය.

වගුව 3- සර්ව සාධාරණත්වය පිළිබද අදහස

| එක් පාර්ශවයකට පමණක් විශේෂ සැලකිලි දැක්වීම | මහජනතාව | | නිළධාරින් සහ ජනතා නියෝජිතයින් | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ඔව් | 16 | 53% | - | - |
| නැත | 12 | 40% | 26 | 87% |
| සමහර අවස්ථා වලදී | 2 | 7% | 4 | 13% |
| | 30 | 100% | 30 | 100% |


මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණය 2015

සර්වසාධාරණත්වය සම්බන්ධයෙන් අදහස් දැක්වූ ජනතාවගෙන් 53% කගේ අදහස වූයේ නගර සභා පාලනය තුළ එක් පාර්ශවයකට පමණක් විශේෂ සැලකිලි දැක්වීමක් පවතින බවය. ඔවුන් ප්‍රකාශ කල ආකාරයට නගර ජනතාවගේ අවශ්‍යතා වලට අවශ්‍ය සේවාවන් සැපයීම වෙනුවෙන් නගර සභා පිහිට වුවද දේශපාලන පක්ෂ ක්‍රමය යටතේ එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන බවයි. දේශපාලන පක්ෂ ක්‍රමය තුළ සර්වසාධාරණත්වයක් දැකිය නොහැකි බවය. නගර සභා පාලකයින් තමන්ගේ හිතවතුන්ට වැඩි සැලකිලි දක්වා ඇති බව ඔවුන්ගේ අදහස විය. එමෙන්ම ටෙන්ඩර් පටිපාටියේ දී, සංවර්ධන ව්‍යාපෘති, මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමේ දී පාලක පිරිසේ හිතවතුන්ට ප්‍රතිලාභ ලැබෙන ආකාරයට එම වැඩසටහන් ක්‍රියාත්මක කරන බවට ඔවුන් චෝදනා කරන ලදී. 40% කගේ අදහස වූයේ නගර සභාව තුළ සර්වසාධාරණත්වයක් පවතින බවය. නගර සභාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින නිසා සියලු දෙනාගේම අවශ්‍යතා වෙනුවෙන් පොදුවේ කැප වන බව ඔවුන්ගේ අදහස විය. 7% කගේ අදහස වුයේ සමහර අවස්ථා වලදී නගර සභා පාලනය තුළ සර්වසාධාරණත්වයක් පැවතියද තවත් සමහර අවස්ථා වලදී එසේ බලාපොරොත්තු විය නොහැකි බවයි. මේ අනුව අදහස් දැක්වූ 53% කගේ අදහස වූයේ නගර සභා පාලනය තුළ සර්වසාධාරණත්වයක් නොමැති බවයි. එමෙන්ම සමහර අවස්ථා වලදී නගර සභා පාලනය තුළ සර්වසාධාරණත්වයක් අපේක්ෂා කල නොහැකි බවට අදහස් දැක්වූ 7% එක්ව ගත් විට 60% නගර සභා පාලනය තුළ සර්වසාධාරණ පාලනයක් පවතිනවාය යන අදහසෙන් දුරස් වී සිටියි. මේ අනුව බහුතර පිරිසක් නගර සභා පාලනය කෙරෙහි සෑහීමකට පත් නොවන බව පෙනී යයි.

නගර සභා නිළධාරීන් සහ මහජන නියෝජිතයින් 87% කගේ අදහස වූයේ නගර සභා පාලනය තුළ පක්ෂ, ජාති, ආගම් භේද වලින් තොරව අවශ්‍ය සංවර්ධන සේවාවන් සලසා දීමට නිරන්තරයෙන් කැපවන බවය. 13% කගේ අදහස වූයේ පක්ෂ දේශපාලන ක්‍රමය යටතේ යම් යම් අඩුපාඩු සමහර අවස්ථා වලදී සිදු විය හැකි වුවත් සියලු ජනතාවට පොදුවේ සේවාවන් සැපයීමට කැප වන බවය.

**නගර සභා පාලනය තුළ යහපාලන සංකල්පයේ ස්වරූපය**

ආයතනික වශයෙන් කාර්යක්ෂම පාලනයක් ගෙන යාමට කළමනාකරණ ක්‍රියාවලියන් වූ යහපාලනය වැදගත් වේ. ජනතාව පළාත් පාලනය හා සම්බන්ධ වන්නේ තමන්ගේ කාර්යයන් මනා ලෙස ඉටු කර ගැනීම සඳහාය. ජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබා දීම ඒ අනුව ප්‍රාදේශීය ආණ්ඩු වල වගකීම වේ. ජනතාව බලාපොරොත්තු වන ආකාරයේ සේවාවක් එම ආයතන වෙතින් ඉටු නොවන විට එවැනි පාලන ක්‍රම වෙතින් ජනතාව දුරස් වීම නොවැලැක්විය හැකිය. එසේ ජනතාව පාලන ක්‍රමයෙන් දුරස් වීම හරහා අත්තනෝමතික පාලන ක්‍රම බිහි වීමට මාර්ගය සැකසේ. ඒ අනුව ප්‍රාදේශීය ආණ්ඩු තුළ යහපාලනයක් පවත්වාගෙන යාම සඳහා දේශපාලන ක්‍රමයට මහජන සහභාගීත්වය වැඩි කල යුතු අතර නෛතික රාමුවක් තුළ ප්‍රාදේශීය ආණ්ඩු ක්‍රියාත්මක විය යුතුය. ජනතාවට නිරන්තරයෙන් පාලනයේ ස්වරූපය හඳුනා ගත හැකි ආකාරයට විනිවිදභාවයෙන් යුතු පළාත් පාලන ක්‍රමයක් පවත්වා ගෙන යා යුතුය. මේ අනුව යම් පාලන ක්‍රමයක් සමස්ත ජනතාවගේ විශ්වාසය, කැමැත්ත, සුහදත්වය හා සහයෝගය සම්බන්ධ කර ගනිමින් පාලනය පවත්වා ගෙන යන්නේ නම් එම පාලනය තුළ යහපාලනයක් පවතී.




***ප්‍රස්ථාර 2- නගර සභාව තුළ යහපාලනයේ ස්වරූපය***

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය 2015

කැස්බෑව නගර සභාව තුළ යහපාලනයේ ස්වභාවය විමර්ශනය කරන විට 47% කගේ අදහස වූයේ නගර සභාව පාලනය තුළ යහපාලනයක් පවත්නා බවයි. ඔවුන් ප්‍රකාශ කල ආකාරයට නගර සභාව හරහා ජනතාවට උපරිම සේවයක් කාර්යක්ෂමව හා ගුණාත්මකව ලබා දීමට කැප වේ. ජනතා අවශ්‍යතා හඳුනා ගෙන ඔවුන්ට අවශ්‍ය සේවාවන් ඉටු කිරීමට වහා ඉදිරිපත් වන බවට ඔවුන් අදහස් පළ කරන ලදී. නමුත් ඊට සාපේක්ෂව නගර සභාව පාලනය තුළ යහපාලනයක් නොමැති බව 53% කගේ අදහස විය. ඔවුන්ගේ අදහස වූයේ යහපාලන ගුණාංග සඳහා පාලන රටාව යොමු වී නොමැති බවයි. අකාර්යක්ෂමතාව, දූෂණ

වංචා, බලය අයුතු ලෙස පාවිච්චි කිරීම, පුද්ගලයින්ට වෙනස් කොට සැලකීම, නායකයින් තමන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට කැප වීම, නෑ හිතවතුන් පිනවීමට පොදු යොදා ගැනීම වැනි හේතු සාධක මත අයහපත් පාලනයකට මාර්ගය සැකසී ඇති බවට ඔවුන් චෝදනා කරන ලදී.

නගර සභාවේ යහපාලනය සම්බන්ධයෙන් අදහස් දැක් වූ මහජන නියෝජිතයින් හා නිළධාරීන්ගේ අදහස වූයේ නගර සභා පාලනය තුළ යම්තාක් මට්ටමකට යහපාලනයක් පවතින බවය. නගර සභාව නිරන්තරයෙන්ම ජනතාවාදී ආයතනයක් ලෙස පොදු මහජනතාවගේ අවශ්‍යතාවයන් හා ඔවුන්ට අවශ්‍ය සේවාවන් කාර්යක්ෂමව හා ගුණාත්මකව ලබා දීමට නිරන්තරයෙන් කැපවීම හරහා යහපාලනය පවත්වා ගෙන යාමට උත්සහ ගන්නා බවය. නගර සභා පාලනය පුද්ගල බද්ධව සිදු වන දෙයක් නිසා යම් යම් අතපසු වීම් සිදු වුවද නිරන්තරයෙන් යහපාලන ගුණාංග මත පාලන රටාව පවත්වා ගෙන යාමට උත්සහ ගන්නා බව පෙන්වා දෙන ලදී. ආයතනික වශයෙන් කාල රාමුවකට අනුව කටයුතු කිරීමත්, නගර සභා කාර්යයන් විවිධ අංශ වලට බෙදා පවත්වාගෙන යාමත් හරහා යහපාලනයක් ආයතනික වශයෙන් පවත්වා ගෙන යාමට උත්සහ ගන්නා බව පෙන්වා දෙන ලදී. නිළධාරීන් වශයෙන් නිතර මහජනතාව හා සමීපව කටයුතු කරන ආයතනයක් වශයෙන් ජනතාවගේ අදහස් හා සහභාගීත්වය ඍජුව ලබා ගනිමින් සියලු ලිපි ලේඛණ කටයුතු පිළිබදව විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීම හරහා යහපාලනයක් පවත්වා ගැනීමට උත්සහා ගන්නා බව ඔවුන්ගේ අදහස විය. එමෙන්ම මහජන නියෝජිතයින් ලෙස මැතිවරණයේ දී කුමන පක්ෂයක් හා සම්බන්ධ වී කටයුතු කලද නගර සභාව තුළ කටයුතු කිරීමේ දී සියලුම ජනතාව එක හා සමාන ලෙස සලකමින් ඔවුන්ගේ අදහස් හා යෝජනා ද ලබා ගනිමින් රටේ පවත්නා ප්‍රධාන නීතියට යටත්ව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීමට කැප වන ආයතනයක් ලෙස නගර සභාව තුළ යහපාලනයක් පවතින බව මහජන නියෝජිතයින්ගේ අදහස විය.

ඉහත දත්ත පරීක්ෂා කිරීමේ දී නගර සභා පාලනය සම්බන්ධයෙන් බහුතරයක් තෘප්තිමත් නොවූව ද ප්‍රදේශයේ පාලන කටයුතු පවත්වාගෙන යාම සදහා නගර සභාවේ අවශ්‍යතාවය සියලු දෙනා පොදුවේ අවධාරණය කරන ලදී. "ඔබ ප්‍රදේශයේ පාලනය ගෙන යාමට නගර සභාව අවශ්‍ය ද" යනුවෙන් කල විමසීමේ දී නියදිය සදහා තෝරා ගත් මහජනතාව(30), නිළධාරීන්(20), මහජන නියෝජිතයින්(10) යන සියලු දෙනාගේ අදහස වූයේ ප්‍රදේශයේ පාලන කටයුතු පවත්වා ගෙන යාමට නගර සභාව අවශ්‍ය බවයි. නගර සභාව පුරවැසියන්ගේ එදිනෙදා ජීවිතය හා අත්‍යන්තයෙන්ම බැදුණු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා, පොදු මංමාවත්, ජනතා සුභ සාධනය, සුව පහසුව හා විනෝදාස්වාදය සැපයීම, හැසිරවීම, පාලනය හා පරිපාලනය කිරීම සදහා පිහිටුවා ඇති නියෝජිත ආයතන වේ. නගර සභා පිහිටුවීමේ අරමුණු අතර ප්‍රදේශයේ අවශ්‍යතා වලට වඩාත් සංවේදී වීම, මහජන සහභාගීත්වය වඩාත් ඵලදායී ලෙස දේශපාලන ක්‍රමය වෙත රදවා ගැනීම වැදගත් වේ. විශේෂයෙන් ප්‍රදේශයේ ජනතාවට තම අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී රටේ මධ්‍යම ආණ්ඩුව හා ඍජුව සම්බන්ධ වී කටයුතු කිරීම අපහසු වේ. විමධ්‍යගත පාලනය හරහා ජනතාවට ප්‍රාදේශීය ආණ්ඩුවල කටයුතු වලට කෙලින්ම සම්බන්ධ වීමේ හැකියාව පවතී. ඒ අනුව ජනතාවට ප්‍රදේශයේ අවශ්‍යතා හදුනා ගත් පිරිසකගේ මග පෙන්වීම අනුව කටයුතු කල හැකි වීම හරහා ප්‍රාදේශීය සංවර්ධනය ගොඩ නගා ගත හැකි වේ. මේ අනුව ප්‍රාදේශීය වශයෙන් යහපාලන සංකල්පය ප්‍රායෝගික යථාර්ථයක් බවට පත්කර ගැනීම සදහා නගර සභාවන් හී ක්‍රියාකාරීත්වය

වැදගත් බව අවධාරණය විය. ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාකාරීත්වය විමර්ශනය කිරීම සඳහා කැස්බෑව නගර සභාව ආශ්‍රයෙන් කල විමර්ශනයේ දී ලබාගත් දත්ත ඉහත දී විමර්ශනයට ලක් විය. එහි දී පැහැදිලි වන්නේ යහපාලන සංකල්පයේ ක්‍රියාකාරීත්වය නගර සභා පාලනය තුළ දුර්වල මට්ටමක පවතින බවය.

**නිගමන සහ යෝජනා**

ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ යහපාලන සංකල්පයේ ක්‍රියාකාරීත්වය විමර්ශනය කිරීම සඳහා කැස්බෑව නගර සභා ආශ්‍රයෙන් කල විමර්ශනයේ දී පැහැදිලි වූයේ යහපාලන මූලධර්ම නෛතික ලෙස ලගා කර ගැනීමේ විධිවිධාන ප්‍රාදේශීය ආණ්ඩුකරණයට ඇතුළත් කර තිබුණ ද නගර සභා පාලනය තුළ යහපාලන මූලධර්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන බවය. යහපාලන සංකල්පයේ ප්‍රධාන මූලකාංගයක් ලෙස හඳුනා ගත හැකි ජනතා සහභාගීත්වය නගර සභා පාලනයෙන් දුරස් වී ඇති බවත් කැස්බෑව නගර සභා ආශ්‍රයෙන් කල විමර්ශනයේ දී පැහැදිලි විය. නගර සභාව සිය කාර්යයන් ඉටුකිරීමේ දි ප්‍රමාණවත් මහජන සහභාගීත්වයක් ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ජනතාව පාලන ක්‍රමයෙන් දුරස් වී ඇත. නගර සභා පාලනය තුළ යහපාලනයක් ගොඩනගා ගැනීමට නම් නගර සභා පාලනයට වැඩි වශයෙන් ජනතාව සහභාගී කර ගත යුතුය. ජනතා සහභාගීත්වය සහිත යහපාලනයක් ගොඩනගා ගැනීමට නගර සභා පාලනයේ ඇති කල හැකි වෙනස්කම් කිහිපයක් යෝජනා කල හැකිය. එනම්, නගර සභා කටයුතු සඳහා ජනතාව සම්බන්ධ කර ගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීම, අයවැය සම්පාදනයේ දී ජනතාවගේ අදහස් ලබා ගැනීම, ජනතාව සහ නගර සභාව සංවාදයක් ඇති කිරීමට ඉවහල් වන ආයතනික යාන්ත්‍රණයක් සකස් කිරීම, නගර සභා මන්ත්‍රීවරුන් සහ ජනතාව අතර සමීප සබඳතාවයක් ගොඩනැංවීමට පියවර ගැනීම, සංවර්ධන කටයුතු සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීම, මානව සංවර්ධනය සඳහා කටයුතු කිරීම, පොදු උපයෝගීතා සේවාවන් ඉහළ නැංවීමට පියවර ගැනීම, ප්‍රජා සේවා කටයුතු පවත්වාගෙන යාම යන යෝජනා මගින් ජනතා සහභාගීත්වය වර්ධනය කර ගත හැකිය.

නගර සභා කටයුතු සඳහා ජනතාව සම්බන්ධ කර ගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීම හරහා ජනතා සහභාගීත්වය පුළුල් කර ගත හැක. එනම්, නගර සභාවට නෛතිකව හිමි වන බලතල ප්‍රයෝජනයට ගනිමින් කමිටු හරහා ජනතාව සක්‍රීය ලෙස දායක කර ගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීම තුළින් ජනතාව මුහුණපාන ගැටළු වලට විසඳුම් සෙවීමත්, විසඳුම් ක්‍රියාත්මක කිරීමත් පුළුල් ජනතා සහභාගීත්වය සහිතව කිරීමෙන් නගර සභාව කෙරෙහි ජනතා විශ්වාසය රඳවා තබා ගත හැකි වේ. මේ ආකාරයට කමිටු ක්‍රමය හරහා නගර සභා කටයුතු වලට ජනතාව සම්බන්ධ කර ගැනීමෙන්, තනි පුද්ගලයෙකුගේ තීරණ වලට වඩා කණ්ඩායමක තීරණ ප්‍රජාතන්ත්‍රවාදී හා නිවැරදි තීරණ වීම, කළමනාකරණ තොරතුරු පද්ධතියක් ඇති කර ගැනීමට හැකි වීම, විවිධ දැනුම හා කුසලතා ඇති බාහිර පුද්ගලයන්ගේ සේවාව ලබා ගැනීමට හැකි වීම.

උදාහරණ ලෙස පරිසරය හා සම්බන්ධ කටයුතු වලදී ගමේ වැදගත් උගතුන්ගේ සේවය ලබා ගත හැකි වීම, ප්‍රදේශයේ පුස්තකාල සේවා සඳහා පාසල්වල විදුහල්පතිවරුන්ගේ ස්වෙච්ඡා සේවාව ලබා ගත හැකි වීම හරහා එම සේවාව වැඩි දියුණු කිරීමට හැකි වීම, ආදී ලෙස ජනතාව සම්බන්ධ කර ගැනීමේ ඉඩකඩ

පවතී. ඒ අනුව ඔවුන්ගේ අදහස් ලබා ගනිමින් හොද සංවර්ධනයක් ප්‍රදේශයේ පවත්වා ගත හැකි වේ. එනම්, මන්ත්‍රීවරුන් පාලනයට ක්‍රියාකාරී ලෙස සහභාගී කරවා ගැනීම, ජනතා සමීප සහභාගීත්වයක් ලබා ගැනීම, තීරණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී ලබා ගන්නා දායකත්වය තුළින් සම්පත් ඌණතාවයන් පිරිමසා ගැනීමට හැකි වීම, පාලනය කෙරෙහි ජනතාව තුළ විශ්වසනීයත්වයක් ගොඩ නැගීම, ජනතාව මුහුණපාන ගැටළු වලට විසදුම් එම ගැටළු වලින් විපාක විඳින පුද්ගලයන් විසින්ම ගනු ලබන ස්වභාවයට පත්කිරීම, දූෂණ වංචා හා අපතේ යාම් වලක්වා ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් යෙදීමට හැකි වීම, පාලන කටයුතු ජනතාව අතර ප්‍රචාරය වීම තුළින් ආරක්ෂණය යන කරුණු කම්ටු ක්‍රමය තුළින් ලබා ගත හැකි විවිධ ප්‍රතිඵල අතර ඇත.

ප්‍රමුඛ පද- යහපාලනය, ප්‍රාදේශීය ආණ්ඩුකරණය, ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා සහභාගිත්වය, අයිතිවාසිකම්

**ආශ්‍රිත ග්‍රන්ථ**


අබේරත්න, උපුල්. (2007). පළාත් පාලන ආයතන, ප්‍රකාශනයඃ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.

අභයවර්ධන, එච්.පී. (1997). ප්‍රාදේශීය සභා සේවා , සුපර් ග්‍රැෆික් නාවල, රාජගිරිය.

ඇදගම, මාලනී. (1997). ශ්‍රී ලංකාවේ ගම්සභ ඉතිහාසය, සරස්වතී මුද්‍රණ සහ ආයතනය, දිවුලපිටිය.

අමරසිංහ, රන්ජිත්., අශෝක ගුණවර්ධන., ජයම්පති වික්‍රමරත්න., ඒ.එම්. නවරත්න බණ්ඩාර (2010). දෙවිසි වසරක බලය බෙදීම, ව්‍යවස්ථා අධ්‍යයන ආයතනය.

ආරියදාස,එච්. (2007). ශ්‍රී ලංකා පලාත් පාලන ඉතිහාසය (මූලාරම්භයේ සිට වර්තමානය දක්වා), කර්තෘ ප්‍රකාශන.

අලුත් පටබැඳිගේ, තුසිත. (2003). යහපාලනය, ප්‍රකාශනය පැෆ්රල් සංවිධානය.

උයන්ගොඩ, ජයදේව., රංජිත් පෙරේරා (2010), ප්‍රජාතන්ත්‍රවාදය කුමක් ද? කාගේද ? කා සඳහා ද? කුමට ද, සීමාසහිත කරුණාරත්න සහ පුත්‍රයෝ, හෝමාගම.

කීර්තිරත්න, ජේ.ජී. (2002).ශ්‍රී ලංකාවේ පලාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ගේ කාර්ය භාරය,කර්තෘ ප්‍රකාශන, කෑගල්ල.

ගුණතිලක, පී. පී., ඇම් .එච්. විමලසේන. (1994). ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක් ද? මාර්ග ප්‍රකාශන.

දිසානායක, ධම්ම. (2007).ප්‍රාදේශීය ආණ්ඩු පාලනය අරමුණු සහ ශික්ෂා , ප්‍රකාශන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.

ධනපාල, ඒ.එච්. (2006). 21 වන සියවසේ ගෝලීය අර්බුද ජනගහනය දිළිඳුකම හා කුසගින්න, ඇස් . ගොඩගේ සහ සහෝදරයෝ , කොළඹ 10.

පුංචිහේවා, එස්.ජී. (2003). යහපාලන අධ්‍යයන ලිපි, පැෆරල් සංවිධානය.

පෙරේරා, විරාජ්. (2003). පළාත් පාලනය එදා සහ අද, ප්‍රකාශනය-පැෆරල් සංවිධානය.

මානවඩු, උපුල්. (2006). ජාතික ගැටලුවට විසඳුම් සහ සදාතනික දේශපාලන දර්ශනය හෙවත් යුක්ති ධර්මවාදය, කර්තෘ ප්‍රකාශන.

විමලසේන, එච්. (1995). ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ආකෘති , මාර්ග ප්‍රකාශන

වීරවර්ධන, අයි.ඩී.ඇස්., මාගරිට්, විරවර්ධන. (1964). ලංකාව සහ රටවැසියා, සීමාසහිත සමන් ප්‍රකාශකයෝ , මහරගම.

වෙලේ ගෙදර, චම්මින්ද. (2006). යහපාලනය, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට් ) ලිමිටඩ්, කොළඹ 10.

ප්‍රජා අධ්‍යයනය අත්පොත

ශ්‍රී ලංකා පලාත් පාලන ආයතනයන් හී නෛතික ව්‍යුහය, පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පර්යේෂණ අංශයේ ප්‍රකාශනයකි.

පළාත් පාලන ආයතන සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය සහ ක්‍රියාත්මක කිරිම පිළිබද අත්පොත (2007), පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පර්යේෂණ අංශයේ ප්‍රකාශනයකි.

යහපාලනය සඳහා කොන්ත්‍රාත් කළමනාකරණය (2006), පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය.

නියාමන සිතියම්:පලාත් පාලන ආයතනයන් හී සේවාවන් පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය.ප්‍රාදේශීය සභා.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත.

1987 අංක 15 දරණ පළාත් සභා පනත.

නගර සභා රීති 1988.

කැස්බෑව නගර සභා අය-වැය වාර්තා. (2000-2010)

කැස්බෑව නගර සභා වාර්තා.

Alam, Javeed. (2004). Who wants Democracy? New Delhi: Orient Longman private Limited.

Amarasinghe, A. L. (1994). *Human Resource Development: Towards Decentralization*.

Graham, John. (2003). Principles for Good governance in the 21st Centure.

Lailan, G. R. T. (1979). *Local Government and Decentralization in Sri Lanka*.

Muhammad, Rahaman. (2006). A Good Governance: Conceptual Analysis, Osaka University Knowledge Archive.

Provincial Council, *Operational Experience of Devolution: Report of the Committee to Study the Operation of the Provincial Council in Sri Lanka*. 1996.